පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සබරගමුව- සතිපාසල

විෂය:- පෙරදිග සංගීතය

සතිය - 8


ශ්‍රේණිය :- 11

Prepared by - කලාප අධ්‍යාපන කාර්යාලය, කෑගල්ල

Weekly School Department of Education, Sabaragamuwa Province/


# පෙරදිග සංගීත ස්වර ප්‍රස්තාර අපරදිග ක්‍රමයට ප්‍රස්තාර කරමු.

මෙහිදී අප පළමුවෙන්ම අපරදිග ස්වර ප්‍රස්තාරයක ඇති සංඛේත,ඒවායේ වටිනාකම් ආදිය පිළිබඳ මූලික අවබෝධයක් ලබා ගත යුතුය. ඒ සඳහා පහත දක්වා ඇති සංඛේත,හා ඒවායේ වටිනාකම් පිළිබඳ අධ්‍යයනය කරමු.




1. Semibreve - මාත්‍රා 4 ක කාලයක් දක්වන සංකේතය.
2. Minim - මාත්‍රා 2 ක කාලයක් දක්වන සංකේතය
3. Crotchet - මාත්‍රා 1 ක කාලයක් දක්වන සංකේතය.
4. Quaver - මාත්‍රා $\frac{1}{2}$ ක කාලයක් දක්වන සංකේතය.
5. Semi Quaver - මාත්‍රා $\frac{1}{4}$ ක කාලයක් දක්වන සංකේතය.
6. Semibreve Rest - මාත්‍රා 4 ක නිශ්ශබ්ද කාලයක් දක්වන සංකේතය.
7. Minim Rest - මාත්‍රා 2 ක නිශ්ශබ්ද කාලයක් දක්වන සංකේතය
8. Crotchet Rest - මාත්‍රා 1 ක නිශ්ශබ්ද කාලයක් දක්වන සංකේතය.
9. Quaver Rest - මාත්‍රා $\frac{1}{2}$ ක නිශ්ශබ්ද කාලයක් දක්වන සංකේතය.
10. Semi Quaver Rest - මාත්‍රා $\frac{1}{4}$ ක නිශ්ශබ්ද කාලයක් දක්වන සංකේතය.
11. Doted Semibreve - මාත්‍රා 6 ක කාලයක් දක්වන සංකේතය.
12. Doted Minim - මාත්‍රා 3 ක කාලයක් දක්වන සංකේතය.
13. Doted Crotchet - මාත්‍රා $1\frac{1}{2}$ ක කාලයක් දක්වන සංකේතය.
14. Doted Quaver - මාත්‍රා $\frac{3}{4}$ ක කාලයක් දක්වන සංකේතය.
15. Doted Semibreve Rest - මාත්‍රා 6 ක නිශ්ශබ්ද කාලයක් දක්වන සංකේතය.
16. Doted Minim Rest - මාත්‍රා 3 ක නිශ්ශබ්ද කාලයක් දක්වන සංකේතය.
17. Doted Crotchet Rest - මාත්‍රා $1\frac{1}{2}$ ක නිශ්ශබ්ද කාලයක් දක්වන සංකේතය.
18. Doted Quaver Rest - මාත්‍රා $\frac{3}{4}$ ක නිශ්ශබ්ද කාලයක් දක්වන සංකේතය.
19. Tie Mark

පෙරදිග සංගීත ස්වර ප්‍රස්තාරයක ඇති නිශ්ශබ්ද මාත්‍රා අපරදිග ප්‍රස්තාරයක දක්වන්නේ **Rest mark** මගිනි. දැන් අපි ඒ පිළිබඳ විමසා බලමු.





මීලඟට අප පෙරදිග ස්වර ප්‍රස්තාරයක එක් විභාගයක සිට තවත් විභාගයක් දක්වා ඇදෙන මාත්‍රා දක්වන්නේ කෙසේදැයි විමසා බලමු. ඒ සඳහා අපරදිග සංගීතයේ **Tie** නැමැති සංඛේතය භාවිතා කරයි. ඒ පහත අයුරිනි.



ඉහත රේඛා මණ්ඩලයේ මාත්‍රා තුනෙන් තුනට ගමන් කරන අයුරු බලන්න.එහි පළමු රේඛා මණ්ඩලයේ ග ස්වරය මාත්‍රා 9ක් දක්වා ඇදේ. එය **Doted Minim** තුනකින් දක්වා ඇත. එක් විභාගයක සිට තවත් විභාගයක් හෝ විභාග කරා නොනවත්වා මාත්‍රා ඇදෙන බව **Tie mark** ලකුනෙන් දක්වා ඇත.

මීලඟට කෝමළ ස්වර තීව්‍ර ස්වර ශුද්ධ ස්වර සංඛේත සහ ඒවා රේඛා මණ්ඩලයේ යොදන අයුරු පහත දක්වා ඇති අයුරු විමසා බලමු.





**තව ද ස්වර ප්‍රස්තාරයක තාලය, අපරදිග සංගීතයේදී Time Signature යනුවෙන් හඳුන්වයි. එනම්,**

- ත්‍රිතාලය, කෙහෙර්වා වැනි මාත්‍රා හතරෙන් හතරට යන තාල = 4/4 **Rhythm**
- දාදරා වැනි මාත්‍රා තුනෙන් තුනට යන තාල = 3/4 **Rhythm**
- ලාවණී වැනි මාත්‍රා දෙකෙන් දෙකට ගමන් කරන තාල = 2/4 **Rhythm**
- දීප්චන්දි වැනි මාත්‍රා තුන සහ හතරට යන තාල = 7/8 **Rhythm**
- ජප් තතාලය = 5/8 **Rhythm** සහ
- බෙම්ටො තාලය 6/8 **Rhythm** ආදී වශයෙනි.

දැන් අපි ඉහත සියළුම කරුණු සැලකිල්ලට ගනිමින් පෙරදිග සංගීතයේ ස්වර ප්‍රස්තාරයක් අපරදිග ක්‍රමයට ප්‍රස්තාර කරමු.

| | | | |
|---|---|---|---|
| ස ප ප - | - - ධ ප | ම ධ ප ම | ග රි රි - |



පැවරුම -:

- මේ ආකාරයට පහත දැක්වෙන පෙරදිග සංගීත ස්වර ප්‍රස්තාරය බටහිර රේඛා මණ්ඩලයක ලියා දක්වන්න.

| | | | |
|---|---|---|---|
| + + රි ග | ම රි ග රි | ස - - - | - - ප ධ |

- ඔබ දන්නා වෙනත් පෙරදිග සංගීත ස්වර ප්‍රස්තාර බටහිර රේඛා මණ්ඩලයක ලියා පුහුණු වන්න.